**කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය - 2013**

**------------------------------------------------------------------**

කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රී.ලං.ප්‍ර.ස.ජ.) සහ ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර බැංකුව (ප්‍ර. සං.ජා.බැ.) අතර එළඹි 2012 මැයි 18 දිනැති අංක 8145 - එල්කේ දරන ණය ගිවිසුමේ 2 වන උපලේඛනයේ II කොටසේ (බී.3 ) සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

**-------------------------------------------------------------------------------**

කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව නාගරික සංවර්ධන අධිකාරිය (නා.සං.අ.) ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව (ශ්‍රී.ල.ඉඩ.ගො.සං.ස) සහ කොළඹ මහ නගර සභාව (කො.න.ස.) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘතියේ අරමුණු වනුයේ කොළඹ ජල ද්‍රෝනියට වැසි ජලය ලැබෙන ප්‍රදේශයේ ගංවතුර අඩු කිරීම, තෝරාගත් ආදර්ශ ආයෝජන මගින් කොළඹ නාගරික ප්‍රදේශයේ පලාත් පාලන ආයතන වල ධාරිතාවය සවිමත් කිරීම සඳහා ප්‍රදේශීය යටිතල පහසුකම් හා සේවා පුනරුත්ථාපනය, වැඩි දියුණු කිරීම සහ නඩත්තුව යනාදියයි. ගිවිසුමට අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එ.ජ.ඩො.මිලියන 321 ක් වන අතර එයින් එ.ජ.ඩො. මිලියන 213 ක් එනම් සියයට 66.35 ක් මූල්‍යයනය කිරීමට ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර බැංකුව එකඟ වී තිබුණි. 2012 ජූලි 10 දින ව්‍යාපෘතිය එහි කටයුතු ආරම්භ කරන ලද අතර 2017 ජුනි 30 වන විට නිම කිරීමට නියමිතය.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සහ යොදා ගැනීමත්,

අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුලත් වේ.

2. විගණන විෂය පථය සහ මතය සඳහා පදනම

---------------------------------------------------

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුව නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනිම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම හා විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී.ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වුයේද යන බව,

(ආ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතන වලින් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උත්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනාගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව,

(ඇ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව,

(ඇ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව,

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව,

(ඊ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව,

(උ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක සහ අවසන් ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ( ශ්‍රී ලං ම බැ ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඌ) ණය ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන් අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(ඒ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව,

3. මතය

-------

මගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මාගේ මතය වූයේ,

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක සහ අවසන් ශේෂ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණ

බව සහ 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය, එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඇ) ණය ගිවිසුම් වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව, සහ

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ ,

(ඊ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

## 4. මූල්‍ය ප්‍රකාශන

### 4.1 මූල්‍ය කාර්යසාධනය

මූල්‍ය ප්‍රකාශන සහ ලබා ගත හැකි වූ තොරතුරු වලට අනුව, සමාලෝචිත වර්ෂයේ ව්‍යාපෘතියේ වියදම රු. 2,358,850,955 ක් වූ අතර 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු. 2,536,381,880 ක් විය.සමාලෝචිත වර්ෂයේ ව්‍යාපෘති වියදම , ඉකුත් වර්ෂයේ වියදම සහ 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| විෂයය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2013 දෙසැම්බර් 31 දිනට වියදම |
|---|---|---|---|
| | 2013 | 2012 | |
| | රු. | රු. | රු. |
| පරිගණක දෘඩාංග හා උපාංග | 4,910,650 | 8,180,788 | 13,770,438 |
| කාර්යාල උපකරණ | 1,568,901 | 351,976 | 2,620,997 |
| ගෘහ භාණ්ඩ හා සවිකිරීම් | 10,049,446 | 932,656 | 11,541,544 |
| මෝටර් වාහන | 31,960,000 | 16,504,000 | 48,464,000 |
| සංවර්ධන වියදම | 2,310,361,998 | 145,529,164 | 2,459,984,901 |
| එකතුව | 2,358,850,995 | 171,498,584 | 2,536,381,880 |

**4.2 විශේෂ (ඩොලර්) ගිණුම**

**-------------------------**

මූල්‍ය ප්‍රකාශන හා ලබා ගත හැකි වූ තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂය තුළ විශේෂ (ඩොලර්) ගිණුමේ මෙහෙයුම් කටයුතු සාරාංශ කර පහත දැක්වේ.

| | 2013 | |
|---|---|---|
| | එ.ජ.ඩො | රු. |
| 2013 ජනවාරි 01 දිනට ශේෂය | 3,039 | 386,406 |
| එකතු කළා : ලැබීම් | 32,116,355 | 4,059,759,618 |
| විදේශ විනිමය ලාභය | - | 123,719,882 |
| | 32,119,394 | 4,183,865,906 |
| අඩු කළා: ආපසු ගැනීම් | 17,225,767 | 2,236,479,495 |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | 14,893,627 | 1,947,386,411 |
| | ========== | ========== |

**5. විගණන නිරීක්ෂණ**

**----------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වොක්ෂෝල් වීදිය, ටී.බී.ජයාමාවත, සහ කුමරන් රත්නම් මාවත යන වීදිවල ගමන් කිරීමේ හැකියාව වැඩිදියුණු කිරීමේ කොන්ත්‍රාත්තුවක් රු.522,782,319 කට පිරිනමා තිබුණු අතර ඉන් රු.292,241,008 ක්වූ මුදලක් 2013 දෙසැම්බර් 31 දින වන විට ගෙවා තිබුණි. පදික ගමන් මාර්ගය මතුපිට සමතලා නොකිරීම ,බාල වර්ගයේ ඇතුරුම් ගල් භාවිතය සහ රියමඟ දෙපස වැහිවතුර එක්රැස් වීම හේතුවෙන් වොක්ෂෝල් වීදිය දෙපස පදික වේදිකා මත සිදු කරනු ලැබූ වැඩිදියුණු කිරීමේ කටයුතු ප්‍රමිතියට අනුකූල නොවූ බව විගණන පරීක්ෂණයේදී අනාවරණය විය.දෙපස කොන්ක්‍රීට් බිත්ති ආධාරයෙන් වැඩිදියුණු කරන ලද ටී.බී.ජයා මාවතෙහි පදික ගමන් මඟ මත කරන ලද පස් පිරවීම විධිමත්ව සිදුකර නොතිබුණි.එම නිසා

එවැනි මාර්ගවල පදිකයන්ගේ ආරක්ෂාව කොන්ත්‍රාත්තුව යටතේ සිදු කරන ලද වැඩිදියුණුකිරිම් තුළින් තහවුරු නොවූ බව නිරීක්ෂණය විය.

(ආ) පුරහල චතුරශ්‍රය තුළ සිදුකරන ලද ආදර්ශ කලාප සංවර්ධනය රු.77,234,251 ක් වූ කොන්ත්‍රාත්තුවක් යටතේ සිදු කරන ලද අතර ඉන් රු.68,756,893 ක් 2014 අප්‍රේල් 04 වන විට ගෙවා තිබුණි.කෙසේ වුවද , මතුපිට නිසිපරිදි සමතලා නොකර පිඩැලි ඇල්ලීමේ කටයුතු සිදුකර තිබුණි. එසේම , භූමිය නඩත්තු කිරීම දුර්වල තත්ත්වයක පැවති බව නිරීක්ෂණය වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස වල්පැළෑටි සහ වෙනත් කුඩා පැළෑටි පිඩැලි මත වැඩෙමින් පැවතුණි. තවද, ගොඩනැගිල්ල වටා වූ ටයිල් අතුරන ලද පෘෂ්ඨය බාහිර පුද්ගලයන් විසින් භාවිතා කර තිබුණු අතර පිරිසිදු කිරීමෙන් තොරව පැවතුණි.

(ඇ) පොදු පහසුකම් වැඩිදියුණු කිරීමේ සංරචකය යටතේ කොළඹ නගරයේ විවිධ ස්ථාන හතක වූ පොදු වැසිකිලි වැඩිදියුණු කිරීමේ කොන්ත්‍රාත්තුව රු.50,953,800 කට පිරිනමා තිබුණු අතර ඉන් රු.43,960,666 ක් 2014 මාර්තු 25 වන විට ගෙවා තිබුණි. වැඩිදියුණු කිරීමේ කටයුතු 2013 ජුනි 24 දින නිම කර තිබුණි.

වැසිකිලි සංකීර්ණ හතකින් පහක සිදුකළ නියැදි පරීක්ෂණයේ දී පහත අඩුපාඩු අනාවරණය විය.

- ජල පද්ධතිය නිසි පරිදි ක්‍රියාත්මක නොවීම.
- ජල සංවේදක පද්ධතිය නිසි පරිදි ක්‍රියාත්මක නොවීම.
- ජල කරාම හා උපකරණ කිහිපයක් අක්‍රීය තත්ත්වයේ පැවතීම.
- මල බැඳුණු විදුලි උපකරණ තිබීම
- පිරිමි වැසිකිලියට සවි කර තිබූ දොර නාඳුනන පුද්ගලයෙකු විසින් ඉවත් කර තිබීම.
- වහලයෙන් වැහි වතුර කාන්දු වීම.

  මෙම ඉදිකිරීම් වගකීම් කාලය තුළ දෝෂ සහිතව පැවතිය ද කොන්ත්‍රාත්කරු විසින් එවැනි දෝෂ හඳුනාගෙන නිවැරදි කිරීම සඳහා යොමු කර නොතිබුණි.

(ඈ) කොළඹ නගරය තුළ පළාත් පාලන ආයතන හතරක යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම හා ධාරිතා වර්ධනය සඳහා රු.මිලියන 5,626.66 කට සමාන එ.ජ.ඩො.මිලියන 49.4 ක මුදලක් වෙන් කර තිබුණි.

මහ නගර සභාවල අරමුදල් උපයෝජනය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| මහනගර සභාව | වෙන්කළ මුදල | | 2013 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කළ අරමුදල් |
|---|---|---|---|
| | එ.ජ.ඩො. මිලියන | රු.මිලියන | රු.මිලියන |
| - කොළඹ මහ නගර සභාව | 36.2 | 4123.18 | 884.30 |
| - ශ්‍රී ජයවර්ධනපුර මහනගර සභාව | 6.1 | 694.79 | 9.40 |
| - දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව | 4.9 | 558.11 | 16.60 |
| - කොලොන්නාව නගර සභාව | 2.2 | 250.58 | - |
| | 49.4 | 5626.66 | 910.30 |

ඉහත තොරතුරු අනුව, කොලොන්නාව නගර සභාව සඳහා වෙන්කරන ලද අරමුදල් සමාලෝචිත වර්ෂය තුළ උපයෝජනය කර නොතිබුණි.එබැවින්, සනීපාරක්ෂක පහසුකම් නොමැති වීම,පළාත් පාලන ප්‍රදේශවල මාර්ග දුර්වල තත්ත්වයක පැවතීම සහ නගරසභාව සඳහා භෞතික සම්පත් නොමැති වීම යනාදී දැවෙන ප්‍රශ්න හඳුනාගෙන ප්‍රමුඛතා පදනම මත ඇමතුම්කර නොතිබුණි.

## 6. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

## 6.1 මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේ සහ 2013 දෙසැම්බර් 31 දක්වා අරමුදල් මූල්‍යයනය, අයවැයගත ප්‍රතිපාදනය සහ අරමුදල් උපයෝජනයට අදාල වැදගත් සංඛ්‍යානමය දත්ත කිහිපයක් පහත දැක්වේ.

| විස්තරය | ණය ගිවිසුම අනුව මූල්‍යනය කිරීමට එකඟ වූ මුදල | | 2013 වර්ෂය සඳහා අයවැය ගත ප්‍රතිපාදනය | | 2013 වර්ෂය තුළ අරමුදල් උපයෝජනය | | 2013 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය | |
|---|---|---|---|---|---|---|---|---|
| | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන | එ.ජ. ඩො. මිලියන | රු. මිලියන | එ.ජ.ඩො මිලියන | රු. මිලියන | එ.ජ.ඩො මිලියන | රු. මිලියන |
| ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර බැංකුව | 213 | 27,890.22 | - | 4000.00 | 16.68 | 2,183.90 | 19.18 | 2,510.96 |
| ශ්‍රී ලංකා රජය | 108 | 14,141.52 | - | 900.00 | 3.16 | 413.31 | 3.66 | 478.22 |
| | ------ | --------- | | ----------- | --------- | ---------- | -------- | ----------- |
| එකතුව | 321 | 42,031.74 | | 4,900.00 | 19.84 | 2,597.21 | 22.84 | 2,989.18 |
| | ===== | ======= | | ======== | ====== | ====== | ==== | ====== |

ඉහත තොරතුරු අනුව , අරමුදල් උපයෝජනය පිළිබඳ අනුපාතය පළමු මෙහෙයුම් වර්ෂ දෙක තුළ ඉතා පහළ මට්ටමක පැවතුණි.

## 6.2 භෞතික කාර්යසාධනය

---------------------------

ව්‍යාපෘති කාර්යයන් සංරචක තුනක් යටතේ ක්‍රියාත්මක විය. 2013 දෙසැම්බර් 31 දින වන විට එම කාර්යයන්වල මූල්‍ය සහ භෞතික කාර්යසාධනය පහත දැක්වේ.

### (අ) සංරචකය 1 - ගංවතුර සහ ජලාපවහන කළමනාකරණය

------------------------------------------------------------

රු. මිලියන 16,800.25 කට සමාන එ.ජ.ඩො.147.5 ක් උප සංරචක තුනක් සඳහා වෙන් කර තිබුණු අතර රු.මිලියන 1,148.59 ක් වටිනා කොන්ත්‍රාත් හතරක් ප්‍රදානය කර තිබුණි.2013 දෙසැම්බර් 31 වන විට රු.මිලියන 239 ක් වැය කර තිබුණි.කළ වැඩ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| පැකේජ අංකය | කොන්ත්‍රාත්තුවේ නම | එකතු කළ අගය මත බදු (VAT) රහිත කොන්ත්‍රාත් වටිනාකම | ගෙවූ මුදල | 2013 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | | | සැලසුම් කළ ප්‍රගතිය | තථ්‍ය ප්‍රගතිය |
| | | රු.මිලියන | රු.මිලියන | | ප්‍රතිශතය |
| එස්එල්ආර්ඩීසී/ඩබ්ලිව්/02 | අලුත්මාවත බෝක්කුව, මුතුවැල්ල හතරැස් කාණුව, මෝදර උමං ප්‍රධාන කුහර, මෝදර සමුද්‍ර මෝය ඇල ඉවුර වැඩි දියුණු කිරීම් සහ ප්‍රධාන කාණුවේ ඇල ඉවුර සුරැකීම | 409.97 | 194.30 | 60 | 60 |
| එස්එල්ආර්ඩීසී / ඩබ්ලිව් /01 | ඇල ඉවුර ඉදිකිරීම, දෙහිවල ඇල සුරැකීමේ කටයුතු | 193.85 | 21.60 | 40 | 40 |
| එයූඩීඒ/ඩබ්ලිව්/03ඒ | ඇල ඉවුර සුරැකීම නැගෙනහිර බේර වැවේ නැගෙනහිර ඉවුර | 269.86 | 23.10 | 41 | 40 |
| යූඩීඒ/ඩබ්ලිව් /03සී | ඇල ඉවුර සුරැකීම බටහිර බේර වැවේ නැගෙනහිර ඉවුර | 274.91 | - | 6 | 4 |
| | එකතුව | 1,148.59 | 239.00 | | |

**(ආ) සංරචක 2 - කොළඹ නගරයේ පළාත් පාලන ආයතන සඳහා නාගරික සංවර්ධන යටිතල පහසුකම් පුනරුත්ථාපනය සහ ධාරිතා වර්ධනය**

---

-මෙම සංරචකය යටතේ, රු.මිලියන 5,763.74 කට සමාන එ.ජ.ඩො. මිලියන 50.6 ක් උපසංරචක තුනක් යටතේ වූ ක්‍රියාකාරකම් 17 ක් සඳහා වෙන් කර තිබුණි.එසේම, රු.මිලියන 5,642.69 ක් වූ කොන්ත්‍රාත් 15 ක් 2013 දෙසැම්බර් 31 වන විට පිරිනමා තිබුණු අතර මෙයින් රු.මිලියන 910.3 ක වියදමක් ව්‍යාපෘතිය විසින් දරා තිබුණි. 2013 දෙසැම්බර් 31 දින වන විට කොන්ත්‍රාත් කාර්යසාධනය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| පැකේජ අංකය | කොන්ත්‍රාත්තුවේ නම | එකතු කළ අගය මත බදු (VAT) රහිත කොන්ත්‍රාත් වටිනාකම | ගෙවූ මුදල | 2013 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | | | සැලසුම් කළ ප්‍රගතිය | තථ්‍ය ප්‍රගතිය |
| | | රු.මිලියන | රු. මිලියන | ප්‍රතිශතය | |
| සීඑම්සී/ඩබ්ලිව්/01 | පොදු පහසුකම් වැඩිදියුණු කිරීම -පැකේජ 01 | 50.95 | 46.50 | 100 | 100 |
| සීඑම්එස්/ඩබ්ලිව්/02 | ගමන් කිරීමේ හැකියාව වැඩි දියුණු කිරීම - පැකේජ 01 | 239.26 | 171.70 | 100 | 100 |
| සීඑම්සී / ඩබ්ලිව් /04 | ගමන් කිරීමේ හැකියාව වැඩි දියුණු කිරීම- පැකේජ 02 | 260.50 | 86.80 | 100 | 100 |
| සීඑම්සී/ඩබ්ලිව්/06 | පුරහල චතුරස්‍රයේ ආදර්ශ කලාප සංවර්ධනය - පැකේජ 02 | 308.88 | 207.40 | 100 | 100 |
| සීඑම්සී/ඩබ්ලිව්/08 | ගමන් කිරීමේ හැකියාව වැඩි දියුණු කිරීම- පැකේජ 03 | 283.51 | 138.60 | 100 | 100 |
| සීඑම්සී/ඩබ්ලිව්/09 | පුරහල චතුරස්‍රයේ ආදර්ශ කලාප සංවර්ධනය- පැකේජ 01 | 77.23 | 22.60 | 100 | 100 |
| සීඑම්සී /ඩබ්ලිව් /07 | පුරහල චතුරස්‍රයේ සංවර්ධනය- පැකේජ 03 | 227.64 | 152.00 | 100 | 90 |

| | | | | | |
|---|---|---|---|---|---|
| සීඑම්සී /ඩබ්ලිව්/12(08) | ගාලු පාර හා ආර්.ඒ.ඩී.මෙල් මාවත පුනරුත්ථාපනය කිරීම- පැකේජ බී | 1,131.10 | 58.70 | 18 | 15 |
| සීඑම්සී/ඩබ්ලිව්/03 | පොදු පහසුකම් වැඩි දියුණු කිරීම - පැකේජ 2 | 44.95 | - | 07 | 12 |
| සීඑම්සී/ඩබ්ලිව්/12(ඒ) | ගාලු පාර හා ආර්.ඒ.ඩී.මෙල් මාවත පුනරුත්ථාපනය කිරීම- පැකේජ ඒ | 813.39 | - | 07 | 06 |
| සීඑම්සී/ඩබ්ලිව්/12(සී) | ගාලු පාර හා ආර්.ඒ.ඩී.මෙල් මාවත පුනරුත්ථාපනය කිරීම- පැකේජ සී | 1,360.92 | - | 03 | 03 |
| | | --------- | -------- | | |
| | උප එකතුව | 4,798.38 | 884.30 | | |
| | | ===== | ==== | | |
| ඩීඑම්එම්සී/ඩබ්ලිව්/02 | යටිතල පහසුකම් සංවර්ධනය- ඩීඑම්එම්සී පැකේජ - 02 | 137.77 | - | 67 | 44 |
| ඩීඑම්එම්සී /ඩබ්ලිව්/03 | යටිතල පහසුකම් සංවර්ධනය - ඩීඑම්එම්සී පැකේජ- 03 | 68.60 | 9.80 | 68 | 48 |
| ඩීඑම්එම්සී /ඩබ්ලිව්/01 | යටිතල පහසුකම් සංවර්ධනය - ඩීඑම්එම්සී පැකේජ- 01 | 246.30 | 6.80 | 50 | 14 |
| | | ------- | ------ | | |
| | උප එකතුව | 452.67 | 16.60 | | |
| | | ===== | ===== | | |
| එස්ජේකේවීසී/ඩබ්ලිව්/01 | යටිතල පහසුකම් සංවර්ධනය එස්ජේකේඑම්සී පැකේජ - 01 | 391.69 | 9.40 | 55 | 36 |
| | | ------ | ------ | | |
| | උප එකතුව | 391.69 | 9.40 | | |
| | | ===== | ==== | | |
| | මුළු එකතුව | 5,642.69 | 910.30 | | |
| | | ===== | ==== | | |